නාරම්මල ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන ගිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පහළ මැදගොඩ පොදු සුසාන භූමිය ඉඩම, අඹගම්මන පෙර පාසල් ගොඩනැගිල්ල හා මහජන බැංකුව අසල පොදු වැසිකිළියේ වටිනාකම හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු කර වටිනාකම් ලබා ගැනීමට ඉදිරි කටයුතු කරන බව.	වටිනාකම් හදුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම යටතේ වූ රු. 214,580 ක ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඇ)	දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස වෙන් කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකර රු. 1,277,110 ක් වූ මුළු ශේෂයම ජංගම නොවන වගකීමක් ලෙස දක්වා තිබුණි.	2025 අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඈ)	ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.40,000,000 ක ස්ථාවර තැන්පත් වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.	2025 අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.

1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගිණුම් විෂයයන් 05ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඊට අදාල උපලේඛනවල ශේෂයන් අතර රු.356,305 ක නොසැසඳීම් පැවතුණි.	2025 අවසන් ගිණුමට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව.	අදාල වෙනස්කම් හදුනාගෙන ලේඛන නිවැරදි කර ඒ අනුව ගිණුම්ගත කිරීම කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මු.රෙ. 570 හා 571	වටිනාකම රු. 1,910,486 ක් වූ වසර 02 ඉක්ම වූ තැන්පත් 113 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට වසර දෙක ඉක්මවූ තැන්පත් කරුවන්ට තම තැන්පත් නිදහස් කරගන්නා ලෙස ලිඛිතව දන්වා ඇති අතර තැන්පත් නිදහස් කර නොගත් තැන්පත් ඉදිරි මාස 3 ඇතුලත ආදායමට ගැණීමට අවශ්‍ය කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව තැන්පත් නියාදනය කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,594,188 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,623,618 ක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024 වර්ෂය				2023 වර්ෂය			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල් කළ ආදායමින්
		(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)
(i)	වරිපනම් හා බදු	13,058	11.849	11,621	4,759	12,753	11,554	9,181	4,530
(ii)	කුලී	29,687	65,405	65,490	858	26,400	27,740	27,578	943
(iii)	බලපත්‍ර ගාස්තු	1,390	2,288	2,288	-	1,390	1,773	1,773	-
(iv)	වෙනත් ආදායම්	58,991	61,702	61,702	-	40,001	33,355	33,355	-
		----------	---------	---------	---------	----------	---------	---------	---------
	එකතුව	103,126	141,244	141,101	5,617	80,544	74,422	71,887	5,473
		======	======	======	=====	======	======	======	=====

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම රුපියල් මිලියන 141 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාලව හිග ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 141 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. ඉකුත් වර්ෂවල හිඟ සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 5 ක් තවදුරටත් අය කර ගැනීමට පැවතුණි.	ටෙන්ඩර් ලබා දී ඇති මස් කඩයකින් හා මාළු කඩයකින් රු.576,241 ක මුදලක් අය වීමට ඇති අතර එය අයකර ගැනීම සඳහා කුලියාපිටිය දිසා අධිකරණයේ නඩු දෙකක් පවරා ඇත. 2024 දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟ ශේෂය රු.4,713,121 ක් වන අතර 2025 මාර්තු 31 දින වන විට එම මුදලින් රු.3,668,603 ක මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී අය කර ගැනීම සඳහා කටයුතු කරන බව.	හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් බදු**		
	වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා ගත යුතු වුවත් 2015 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණි.	2021 මැයි 20 වන දින නව තක්සේරුවක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කර තිබුණත් එම කාර්යය ඉටු නොවූ බව.	වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු කර ඒ අනුව බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **කුලී**

(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පසුගිය වර්ෂවල හිඟද ඇතුළුව රු.858,000 ක මුදලක් අය කර ගැනීමට පැවතුණි.	තව දුරටත් අයකර ගැනීමට ඇති මුදල අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 වර්ෂය සඳහා සභාව සතු වාර්ෂික බදු කුලී මත ලබාදෙන දේපල 44 න් ලංසු වටිනාකම රු.7,290,680ක් වූ දේපල 22ක් වර්ෂය තුල බදු දී නොතිබුණි.	සිව්වරක් ටෙන්ඩර් කළද ඉල්ලුම් කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් වත්කම් 20 ක් බදු දීමට නොහැකි විය.	ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීමට හේතු විමසා බලා නැවත ටෙන්ඩර් කර දේපල බදු දීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරි ඇති කායර්යන් ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විට ව්‍යවස්ථා 53 ක් වැළඳගෙන තිබුණත් ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි.	ගැසට් අංක 1705, 1716, 1964, 2030, 1992 හා 1712 යටතේ අතුරු ව්‍යවස්ථා පනවා ඇති බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු විධිමත් කිරීමට ක්‍රියාකල යුතුය.
(ආ)	ඝන අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ මධ්‍යස්ථාන 200කට ආසන්න ප්‍රමාණයකින් රැස්කර ගන්නා ඉලෙක්ට්‍රොනික් අබලි ද්‍රව්‍ය (රූපවාහිනී , ටියුබ් හා වීදුරු බල්බ) අවිධිමත් ලෙස බැහැර කිරීම හා පිළිස්සීම හේතුවෙන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍යවල පවතින බැරලෝහ ප්‍රදේශයේ ජල මූලාශ්‍රවලට එකතු වීමේ වැඩි අවදානමක් හා වායුගෝලය දූෂණය වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපාර පිළිබඳ අවස්ථා කිහිපයකදී පළාත් පරිසර අධිකාරිය ඇතුළු සියළුම රාජ්‍ය ආයතන මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති බව.	පාරිසරික හානිය අවම වන ලෙස කටයුතු කළ යුතුය.
(ඇ)	ඔලියදෙණිය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම අත්කර ගැනීම වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද රු.8,000,000 ක මුදල 2024 පෙබරවාරි 04 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීම් කර තිබුණද ඉඩම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා අදාළ බලධාරීන් දැනුවත් කර ඇති බව.	ඉඩම පවරා ගැනීමට ක්‍රියාකළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 7 ක රු.22,344,475 ක ශේෂයක් පැවති අතර එම ශේෂය තුල අවුරුදු 1 ත් 5 ත් අතර කාලයට අදාළව රු.22,337,974 ක් පැවතුණි.	ලැබිය යුතු ගිණුම් වලින් වැටුප් ප්‍රතිපූරණය ලෙස මේ වන විට රු.3,668,603 ක්, කඩ කුලී හිග ශේෂයෙන් රු.246,596 ක් හා අත්තිකාරම් ශේෂය මේවන විට පියවා ඇති බව.	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 17 ක රු.47,527,025 ක ශේෂයක් පැවති අතර ඒ තුල වසර 05 ඉක්ම වූ රු.11,584,241 ක ශේෂයක් හා වසර 1 ත් 5 ත් අතර කාලයක් ගත වූ රු.35,942,785 ක ශේෂයක් පැවතුණි. මේවායේ පැවැත්ම තහවුරු කර ගෙන නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි.	ගෙවිය යුතු ණයහිමියන්ගෙන් වියදම් ණයහිමියන් රු.4,799,066 ක්, කර්මාන්ත ණයහිමියන්ගෙන් රු.8,026,129 ක් සැපයුම් ණයහිමියන්ගෙන් රු.516,076 ක් මේ වන විට පියවා ඇති අතර පොදු තැන්පත් ලේඛනයේ පවතින අවුරුදු 02 ඉක්මවූ ශේෂයන් ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	ගෙවිය යුතු මුදල්වල පැවැත්ම සොයා බලා පියවීමට කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් නඩත්තු කරන සුසාන භූමිවල භෞතික ආරක්ෂාව තහවුරු වන පරිදි මැනුම් කර වැට මායිම් සකස් කළ යුතු වුවත්, සුසාන භූමි 69 ක වැට මායිම් යොදා ආරක්ෂා කිරීමට ක්‍රියා කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාව වෙත පැවරීම් කර ඇති සුසාන භූමි මැනුම් කර ඇති බැවින් එම සුසාන භූමිවල වැට මායිම් සකස් කිරීමට කටයුතු කරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු පොදු ළිං හා නළ ළිං හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	2024 වර්ෂයේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පොදු ළිං හා නළ ළිං හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර ඇත. ඒ අනුව සභා බල ප්‍රදේශයේ පොදු ළිං 108 ක් හා නළ ළිං 77 ක් හඳුනාගෙන ඇති බව.	වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව සතුව පවතින පොදු ළිං සහ නළ ළිං ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	සභාව සතු පොදු ළිං හා නළ ළිං ලේඛණ යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව.	ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.

(ඇ)	වටිනාකම රු.116,924,629 ක් වූ ඉඩම් කැබලි 10 ක අයිතිය නාරම්මල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	මෙම පවරා ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියේදී සිදුකර ගැනීමට කටයුතු කරන බව.	පවරා නොගත් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සුසාන භූමි සහ මිනීපිටි සම්බන්ධව නිසි බලධරයා ප්‍රාදේශීය සභාව වුවත් සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 77 අතරින් 68 ක අයිතිය සභාව සතුව නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව එක්ව මේ වන විට ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමේ කටයුතුවලට අදාල කාර්යන් සිදු කරමින් පවතින බව.	පවරා නොගත් සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඇස්තමේන්තුගත වටිනාකම රු.1,690,000 ක් වූ කර්මාන්ත 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.	2025 වර්ෂය් වැඩ නිම කිරීමට ණයහිමි කර ගිණුම්ගත කර ඇති බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 7 ක් හා අතිරික්ත 15 ක් පැවති අතර පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.	ඉදිරියේදී රජය මගින් ගනු ලබන තීරණ අනුව පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව හා අනුමත නොවූ තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 25 දින ඉදිරිපත් කර තිබුණද එහි අවිනිශ්චිත ගිණුමේ රු.1,179,017 ක ශේෂයක් පැවතීම සහ සමහර ගනුදෙණු සටහන් කිරීමට නොහැකිවීම හේතුවෙන් 2025 මැයි 21 දින ආපසු භාරගත් අතර නැවත සංශෝධනය කර 2025 ජුනි 03 දින ඉදිරිපත් කෙරුණි.	2025 පෙබරවාරි 25 දින විගණනයට භාරදෙන ලද මූල්‍ය ප්‍රකාශනයේ විගණනය විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදිකර නැවත 2025 ජුනි 03 දින විගණනයට ඉදිරිපත් කරන ලද බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර්මාන්ත 66 ක් වෙනුවෙන් සලසා තිබුණු රු.4,755,000 ක ප්‍රතිපාදන මුදල් උපයෝජනය කර නොතිබුණි.	2024 වර්ෂයේ පැවති තද වැසි හේතුවෙන් හා අයහපත් කාලගුණය හේතුවෙන් ආපදාවට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කළ අතර මහජන ඉල්ලීම් මත සම්පූර්ණයෙන් ගමනාගමනයට බාධා සිදු වූ මාර්ග සැකසීමට සිදු වූ බැවින් දැඩි ආපදාවට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කරන ලද බව.	අයවැය මඟින් ප්‍රතිපාදන සලසා ඇති හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති ඉටුකළ යුතුය.
(ආ)	වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ ව්‍යාපෘති 53ක් වෙනුවෙන් රු.5,935,286 ක් වැය කර තිබුණි.	අධික ලෙස ආපදාවට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට සිදු වූ බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 03 ක අයවැයගත ආදායම හා සත්‍ය ආදායම අතර සියයට 4 ක සිට සියයට 31 ක දක්වා විචලනයක් පැවති අතර වියදම් විෂයයන් 08 ක අයවැය ගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 15 ත් සියයට 79 ත් අතර විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	ඉදිරි අයවැය සකස් කිරීමේදී නිවැරදි හා සත්‍ය ආදායම් පුරෝකථන හා සමීක්ෂණ මත යථාර්තවාදී අයවැය සකස් කිරීමටත්, විශේෂයෙන් සභා අරමුදල් උපයෝගී කරගනිමින් සිදුකිරීමට අපේක්ෂිත අයවැය ගත කර්මාන්තවලට ප්‍රමුඛතාවය ලබාදී එම කර්මාන්ත සිදු කිරීමටත් අවශ්‍ය කටයුතු කරන බව.	අයවැය ලේඛනය ආයතනයේ කළමනාකරණයට සහය වන පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට හැකි වන පරිදි සකස් කළ යුතුය.

4.4 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 95 වගන්තිය ප්‍රකාරව මළ හෝ එවැනි ද්‍රව්‍ය පීඩාවක් සිදු නොවන අන්දමින් බැහැර කළ යුතු බවට වගබලා ගැනීමට අවශ්‍ය සියලු වැඩ පිළිවෙලවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන සැලැස්විය යුතු වුව ද , ගලි අපද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙහි අක්‍රමවත් ලෙස බැහැර කරන මළ අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළව, පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	මිනිස් වාසයට දුරස්ථව පිහිටා ඇති මෙම ගලි වලවල්වලට ගලි බැහැරලීම සම්බන්ධයෙන් මෙතෙක් පැමිණිලි ලැබී නොමැති අතර ඔලියදෙණිය ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට යාබදව අක්කර දෙකක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගලි අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති බව.	මහජන පීඩාවන් සිදු නොවන පරිදි හා පරිසරය ආරක්ෂා වන පරිදි කසළ හා ගලි බැහැර කිරීම සිදු කළ යුතු අතර අදාළ බලපත්‍ර ලබා ගත යුතුය.

4.5 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ලෙස 2030 වනවිට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම වැනි සභාවට ළඟාවිය නොහැකි අරමුණු දක්වා තිබුණු අතර, සභාවට ප්‍රායෝගික වූ තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.	මේ වන විට ප්‍රායෝගිකව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට සභාව විසින් කටයුතු කර ඇති බව.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.